සියළුම හිමිකම් ඇවරිණි.
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# අ.පො.ස (උසස් පෙළ) උපකාරක පරීක්ෂණය
# க.பொ.த (உயர்தர) உதவிப் பர்ட்சை - 2024
# Support Test Paper for G.C.E. (A/L)

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 13 | විෂයය / பாடம் / Subject: නර්තනය | පත්‍රය / வினாத்தாள் / Paper: 1 වන පත්‍රය | පැය / மணித்தியாலம் / Hours: පැය 02 |

අංක 01 සිට 25 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමේදී නිවැරදි හෝ වඩාත්ම ගැළපෙන පිළිතුර තෝරා ඊට අදාල අංකය ප්‍රශ්නය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

1) "පත්තිනිහාමි" යන නාමය ව්‍යවහාර කරනුයේ,

i. රට යකුවිදිය
ii. සන්නි යකුවිදිය
iii. දෙවොල් මඩුවේදී ය
iv. පූනා මඩුවේදී ය
v. ගරා මඩුවේදී ය (.............)

2) වන්නකුරාළ යන පදය ව්‍යවහාර කරනුයේ,

i. රට යකුවිදිය
ii. සූනියවිදිය
iii. දෙවොල් මඩුවේදීය
iv. වලියක් මංගල්‍යයේදීය
v. ගරා මඩුවේදීය (.............)

3) ව්‍යවහාරික නර්තන කලාව හා සන්නි සංවාද යන කෘති රචනා කළේ,

i. තිස්ස කාරියවසම් හා කෝට්ටේගොඩ ජයසේන
ii. තිස්ස කාරියවසම් හා කේ.ඇස්. ප්‍රනාන්දු
iii. මුදියන්සේ දිසානායක හා ලයනල් බෙන්තරගේ
iv. තිස්ස කාරියවසම් හා සව්රිස් සිල්වා
v. එදිරිවීර සරත්චන්ද්‍ර හා ජයසේන කෝට්ටේගොඩ (.............)

4) මාත්‍රා තුනේ තනි නිතට හා මාත්‍රා 3 + 4 නිතට නටන වන්නම් දෙකකි,

i. නෛඩි හා මයුරා
ii. ගජගා හා හනුමා
iii. නෛඩි හා සැවුළා
iv. සනපති හා සුරපති
v. සනපති හා ගජගා (.............)

5) තෙල්මේ හා වාහල නැටීම හා පද නර්තනය දැකිය හැක්කේ,

i. උඩරට ගම්මඩුව

ii. සබරගමු පහන් මඩුවේ

iii. උඩරට ගී මඩුවේ

iv. පහතරට දෙවොල් මඩු

v. පහතරට රටයකුමේ (.............)

6) රබින්ද්‍රාත් තාගෝර් තුමා නිෂ්පාදනය කර නෘත්‍ය නාටකයක් හා එතුමා පිහිට වූ කාලායතනයක් වන්නේ,

i. ශාපමෝචන් හා ශාන්ති නිකේතනය

ii. කල්පනා හා කතකලි කේරළ කලා මණ්ඩලය

iii. කල්පනා හා කලා ක්ෂේත්‍රය

iv. ජීවණ රිද්මය හා කලා ක්ෂේත්‍රම

v. ජීවණ රිද්මය කේරළ කලා මණ්ඩලය (.............)

7) බලි ශාන්ති කර්මයේදී බලි ඇදුරා අත දරණ රංග භාණ්ඩ දෙක වන්නේ,

i. අත්මිණිය හා පන්දම

ii. අත්මිණිය හා සවරම්පටිය

iii. පන්දම හා කෝලායුධය

iv. ඊගහ හා අත්පන්දම

v. අත්මිණිය හා රිරි මුගුර (.............)

8) නර්තන කලාව පිළිබඳ රූකම් හමුවන ස්ථාන ලෙස දැක්විය හැක්කේ,

i. කොට වෙහර, ලංකාතිලකය, ගනේගොඩ දේවාලය

ii. යාපහුව, ඇම්බැක්කේ දේවාලය, ගඩලාදෙණිය විහාරය

iii. මැදිරිගිරිය, අටදාගෙය, සැටදාගෙය

iv. දොගොල් දොරුව, ගනේගොඩ දේවාලය, ලංකා තිලකය

v. යාපහුව, ඇම්බැක්ක, ගඩලාදෙණිය විහාරය (.............)

9) නර්තන ශෛලීන් දෙකක් හදුනාගැනීමට ඉවහල් වන සාධක වන්නේ,

i. රංග වස්ත්‍රාභරණ හා වෙස් මුහුණුය

ii. සංවාද හා ගායනය

iii. රංග වස්ත්‍රාභරණ හා ආභරණ

iv. සංවාද හා ආහාර්ය අභිනය

v. සංවාද හා වෙස් මුහුණු (.............)

10) කතක් නර්තනයේ ලක්නව් ගුරුකුලයේ ප්‍රවීණ නර්තන ශිල්පීන් දෙදෙනෙකි.

i. ගෝවින්ද ප්‍රසාද් හා බිර්ජු මහාරාජ්

ii. නාරායන් රාම් හා අච්චන් මහාරාජ්

iii. ලච්ජු මහාරාජ් හා නාරායන්රාජ්

iv. ශම්බු මහාරාජ් හා ගෝවින්ද ප්‍රසාද්

v. අච්චන් මහාරාජ් හා බිර්ජු මහාරාජ් (.............)

11) භරත නර්තන නෘත්‍ය කොටසට අයත් නර්තන අංග වනුයේ,

i. අලාරිප්පු, ජතිශ්වරම්, තිල්ලානා

ii. අලාරිප්පු, ජතිශ්වරම්, පදම්

iii. ශ්ලෝකම්, තිල්ලානා, පදම්

iv. ශ්ලෝකම්, තිල්ලානා, අලාරිප්පු

v. ශබ්දම්, පදම්, තිල්ලානා (.............)

12) "අන්දර කැලේ දරි ලියේ කුරුමිණියා" මෙහි ඇති ලඝු හා ගුරු අක්ෂර ගණන නිවැරදි ව දක්වා ඇත්තේ,

i. ලඝු 07 ගුරු 05

ii. ලඝු 08 ගුරු 05

iii. ලඝු 08 ගුරු 04

iv. ලඝු 09 ගුරු 05

v. ලඝු 09 ගුරු 04 (.............)

13) 

මෙම රූපයේ දැක්වෙන වෙස් මුහුණ වන්නේ,

i. ගරා මුහුණු

ii. අභිමානාගේ මුහුණ

iii. සූනියම් යක්ෂණියගේ මුහුණ

iv. කළු යක් මුහුණ

v. රීරි මුහුණ (.............)

14) මණිපුරි නර්තනයේ කෙටි දුහුල් සාය හා ඉන පටිය නම් කර ඇත්තේ,

i. පොෂ්වාන් හා ක්වාංගොයි

ii. කුම්මි හා පොෂ්වාන්

iii. රිෂම් පුරට් හා ක්වාංගොයි

iv. චෝලිය හා ලෙහෙංගා

v. පෝෂ්වාන් හා කුම්මි (.............)

15) පක්වාජ් හා තබ්ලාව වාදනය කරනු ලබන්නේ කුමන භාරතීය නර්තන සම්ප්‍රදායන්ද ?

i. දක්ෂිණ භාරතයේ භරත නර්තනයට

ii. දක්ෂිණ භාරතයේ කතකලි නර්තනයට

iii. දක්ෂිණ භාරතයේ කුච්චිපුඩි නර්තනයට

iv. උත්තර භාරතයේ කතක් නර්තනයට

v. උත්තර භාරතයේ මණිපුරි නර්තනයට (.............)

16) පහන් මඩු ශාන්ති කර්මයට පමණක් ආවේණික වූ නාට්‍යමය පෙළපාලි වනුයේ,

i. අසුරයක්කම හා පොත්කඩේ යක්කම

ii. අසුර යක්කම හා දොවොල් ගොඩ බෑවීම

iii. අඹ විදමන හා දෙවොල් ගොඩබෑවීම

iv. රාමා යක්කම හා නයා යක්කම

v. ඪ. රාමා යක්කම හා මරා ඉපැද්දීම (.............)

17) පා සරඹ මංඩි පද නැටීමෙන් පසු ආධුනිකයකු විසින් අභ්‍යාස කල යුතුව ඇත්තේ,

i. ගොඩසරඹ, කරඬු පද, අත්සරඹ

ii. අත්සරඹ, ඉලංගම් සරඹ, වට්ටම්

iii. මංගලම්, එක්තාලය, ගොඩසරඹ

iv. අත්සරඹ, මාත්‍රා පහ, වට්ටම

v. ගොඩ සරඹ, ඉලංගම් සරඹ, මංඩි පද (.............)

18) “ආනේ මී මැස්සේ මල් රොන් ”, මෙය,

i. ජන කවි වලට අයත් බඹර කවියකි.

ii. ජන කවි වලට අයත් පතල් කවියකි.

iii. සුවිසි විවරණ වලට අයක් පන්තේරු කවියකි.

iv. ශාස්ත්‍රීය ගායනයකි.

v. උඩැක්කි කවියකි. (.............)

19) කතකලි නර්තන සම්ප්‍රදාය බිහිවීමට පාදක වූ රාමාට්ටම් හා ක්‍රිෂ්ණාට්ටම් රචනා කලා යැයි සලකන්නේ,

i. කොට්ටාරක්කර තාම්පුරන් රජු හා කැලිකට් රාජා ජැමොරින්

ii. වල්ලතෝල් නාරායන මෙනන් හා රම්මුණි මෙනන්

iii. ක්‍රිෂ්ණ නායර් හා කැලිකට් රාජා ජැමොරින්

iv. කාර්තික තිරුණාවල් මහාරාජා හා කොට්ටාරක්කාර රජු

v. උන්නායි වරියර් හා වල්ලතෝල් නාරායන මෙනන් (.............)

20) පහතරට නර්තන සම්ප්‍රදායේ වෙස් මුහුණු භාවිතා කර ඇත්තේ,

i. යකුන් ඇදහීම බෙහෙවින් සිදු වී ඇති නිසාය.

ii. හාස්‍ය රසය භයානක රසය දැනවීම සඳහාය.

iii. රංග වස්ත්‍රාභරණ විචිත්‍රත්වය දැනවීම සඳහාය.

iv. චරිතයේ චරිත ස්වභාවය තීව්‍ර කර දැක්වීම සඳහාය.

v. පිරිමින් පමණක් නර්තනයේ යෙදුනු නිසාය. (.............)

21) "දොංත ගතම් දොංත ගති ගතම්"යන පදයෙන් සභාවට පිවිසෙන කෝලම් චරිතය වන්නේ,

i. මුදලිය

ii. අණ බෙරකරුය

iii. ජසයා ය

iv. ලෙංචිනාය

v. නොංචි

(.............)

22) අඩඉර, බොකුහම් සහ ගැටිය යොදාගනු ලබන්නේ පිලිවෙලින්,

i. ගැටබෙරය, පහතරට බෙරය සහ මුම්මැඩිය සඳහාය

ii. ගැටබෙරය, පහතරට බෙරය, දවුල සඳහාය

iii. ගැටබෙරය, රබාන හා දවුල සඳහාය

iv. උඩැක්කිය, තම්මැට්ටම හා දවුල සඳහාය

v. උඩැක්කිය, රබාන සහ තම්මැට්ටම සඳහා ය (.............)

23) මාත්‍රා 2 + 4 තාල රූපයට සමාන වන තාලය වන්නේ,

i. රූපක තාලයයි

ii. ආදි තාලයයි


iii. මිශ්‍ර චාපු තාලයයි

iv. ඛන්ඩ චාපු තාලයයි

v. තිශ්‍ර චාපු තාලයයි

(.............)

24) පහතරට ශාන්තිකර්ම ඡායාරූප කිහිපයක් පහත දැක්වේ.

- ඉහත ඡායාරූප වලින් දැක්වෙන්නේ පිළිවෙලින්,

i. පන්දම්පාලිය, කපුයක්කාරිය, සළුපාළිය
ii. පන්දම්පාලිය, කපුයක්කාරිය, මරුසන්නිය
iii. සළුපාළිය, කපුයක්කාරිය, පන්දම්පාලිය
iv. සළුපාළිය, නානුමුරය, පන්දම්පාළිය
v. කපුයක්කාරිය, මරු සන්නිය, සළුපාළිය (.............)

25) නර්තනයේ පුද්ගල හා පොදු අවකාශ භාවිතා කිරීමේ මූලධර්ම මත යොදා ගන්නා තල හා දිසා සංඛ්‍යාව කීයද?

i. තල 03 දිසා 06
ii. තල 04 දිසා 07
iii. තල 03 දිසා 10
iv. තල 04 දිසා 08
v. තල 04 දිසා 06 (.............)

26) වලියක් මංගල්‍යයේ යක් දෙස්සන්ගේ හිසට පළඳිනු ලබන ආභරණය .......................... ලෙස හඳුන්වයි.

27) දේවාල දොරටුව පිල්කඩ අභියස කෙසෙල් කොළ මත ස්ථාන තුනක වලියක් තුන් කට්ටුව වෙනුවෙන් සාදන ලද බත .......................... ලෙස නම් කරයි.

28) මිශ්‍රචාපුතාලය, ඛන්ඩතාල යන තාල භාවිතා කරනුයේ .......................... තාල පද්ධතියේ ය.

29) ගුරු ගල්, පොල් කටු, මකුළු මැටි, කොළ වර්ණ භාවිතයෙන් ග්‍රහයන්ට වර්ණ ගැන්වීම සිදු කරයි. එහිදී හිරු ග්‍රහයාට අයත් වර්ණය වන්නේ .......................... පැහැයයි.

30) තේවා වාදනයේදී අත්‍යාවශ්‍ය භාණ්ඩයක් වන තම්මැට්ටම සඳහා ව්‍යවහාර කරන තවත් නාමයක් වන්නේ, .......................... යි.

31) රිදී විහාරයෙහි ඇති ඇත් කැටයම් වල නලඟන රූප දක්නට ලැබෙන්නේ .......................... යුගයේය.

32) නවාබ් වජිද් අලීෂා රජු වසරක් පාසා පැවත් වූ .......................... මහෝත්සවයේදී ඉන්ද්‍රා ලෙස නර්තන ඉදිරිපත් කළේය.

33) භරත නාට්‍යයම් වල ගී පද......................... ලෙස හැඳින්වුයේය.

34) කතක් නර්තනයේ භාවිතා වන තත්භාණ්ඩය .........................ලෙස හඳුන්වයි.

35) රබන් නැටුම ආරම්භ වී යයි මතයක් පවතින්නේ ශ්‍රී ලංකාවේ රජ කල ......................... දවසය.

❖ **36 සිට 50 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු තිත් ඉර මත ලියන්න.**

36) දුනුමාලප්පුව හා කෝල් පාඩුව නර්තනයන් වල දී ශිල්පියාගේ අතේ දක්නට ලබෙන්නේ,

i. ………………………………………...

ii. …………………………………….…..

37) පහත දැක්වෙන රූප සටහන සම්බන්ධ ශාන්තිකර්මය හා අදාල සැරසිල්ල නම් කරන්න.



i. ………………………………………...

ii. …………………………………….…..

38) කතක් නර්තන ඉතිහාසයේ වැදගත් කාලසීමාවක් වන ඖද්හි පාලනය කල අවසන් රජු හා ඔහුට අයත් නර්තන කුලය කුමක්ද?

i. ………………………………………...

ii. …………………………………….…..

39) මණිපුරි නර්තනයේදී රාධාගේ ඇඳුමේ දුහල් සාය හා හැට්ටය නම් කර ඇත්තේ,

i. ………………………………………...

ii. ………………………………………...

40) ඉංලගෝ ආඩියල් හා සාරංදේව විසින් ලියන ලද කෘති දෙක සඳහන් කරන්න.

i. ………………………………………...
ii. ………………………………………...

41) "රේණු දොඩම් දෙහි ඇඹුලයි ගාන්නෙ" යන කවිය. අයත්වන ශාන්ති කර්මය හා පෙළපාලිය නම් කරන්න.

i. ශාන්ති කර්මය - ………………………………………...
ii. පෙළපාලිය - ………………………………………...

42) මාත්‍රා පහ නැටුම් දැකිය හැක්කේ කිනම් නර්තන සම්ප්‍රදායන් දෙකේද?

i. ………………………………………...
ii. ………………………………………...

43) පහත දැක්වෙන ශිල්පීන් නියෝජනය කරන නර්තන සම්ප්‍රදායන් නම් කරන්න.

i. බිර්ජු මහාරාජ් - ………………………………………...
ii. කැලිකට්හි ජැමොරීන් - ………………………………………...

44) බැරිසිල් මුද්‍රා නාට්‍යයේ සංගීතය හා නර්තන නිර්මාණය කල ශිල්පීන් දෙදෙනා නම් කරන්න.

i. ………………………………………...
ii. ………………………………………...

45) පහත (i) හා (ii) රූපසටහන් වලින් පිලිඹිබු කරන චරිත නම් කරන්න.

(i)



(ii)



i. ………………………………………...
ii. ………………………………………...

46) ඉහත (i) හා (ii) රූපසටහන් වලින් පිලිඹිබු කරන නාටක දෙක නම් කරන්න.

i. ……………………………………………...
ii. ……………………………………………...

47) නට් ක්රැකර් බැලේ නිර්මාණයේ නර්තන රචකයා හා සංගීත නිර්මාණ ශිල්පීන් දෙදෙනා නම් කරන්න.

i. ……………………………………………...
ii. ……………………………………………...

48) පිළිවෙලින් කිරිමැස්ස, දොළොස්මගල යන රංගභූමි අලංකරණ අයත් ශාන්ති කර්ම දෙක වන්නේ,

i. ……………………………………………...
ii. ……………………………………………...

49) 

මෙම රූප සටහන හා සම්බන්ධ ශාන්ති කර්මය පැවැත්වෙන ස්ථානය හා අවස්ථාව නම් කරන්න.

i. පැවැත්වෙන ස්ථානය - ……………………………………………...
ii. අවස්ථාව - ……………………………………………...

50) සම්ප්‍රදායික කතකලි සංදර්ශනයක් කරන බවට සන්නිවේදනය කරන වාදනය හා ඒ සඳහා භාවිතා කරන ප්‍රධාන ඝන වාද්‍ය භාණ්ඩයක් නම් කරන්න.

i. ……………………………………………...
ii. ……………………………………………...

සියළුම හිමිකම් ඇවරිණි.
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

අ.පො.ස (උසස් පෙළ) උපකාරක පරීක්ෂණය
க.பொ.த (உயர்தர) உதவிப் பர்ட்சை - 2024
Support Test Paper for G.C.E. (A/L)

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 13 | විෂයය / பாடம் / Subject: නර්තනය | පත්‍රය / வினாத்தாள் / Paper: 2 වන පත්‍රය | පැය / மணித்தியாலம் / Hours: පැය 03 |

- පළමුවන කොටසේ ප්‍රශ්න අංක (1) සහ (2) අනිවාර්ය වේ.
- ( i ) හා ( ii ) කොටස් වලින් එක් ප්‍රශ්නය බැගින් ඇතුළත් වන සේ තෝරාගත් ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකටම ( i ) හා ( ii ) කොටස් වලට ලකුණු 06 ක් ද ( iii ) කොටසට ලකුණු 08 ක් ද වශයෙන් මුළු ලකුණු 20 ක් පිරිනැමේ.

## I කොටස

1) පහත සඳහන් බෙර පද අතුරින් ඔබ උගත් නර්තන සම්ප්‍රදායට අයත් බෙර පදය තෝරා ගෙන ප්‍රස්තාර කරන්න.

   i. "දොමිත තදොම් තදොම් රුඳ ගජිං තකට ගත කඳගත"

   ii. "දොං දොං ගත ගත් දිත් තාකු"

   iii. "ජිං කිටිකත් තත් කිටි තක."

2) පහත සඳහන් කවි පදය මාත්‍රා තුනේ තනි තිතේ තාල රූපයට ප්‍රස්තාර කරන්න.

   "සුගත් දහම් සඟ රත්නෙ වැඳිල්ලා
   රැගත් සුරත් සැම දෙවි ඇදහිල්ලා"

3) ගණපති වන්නමේ අඩව්ව හෝ ලලිත රාග තාලය ඉරට්ටිය හෝ තිසරා වන්නමේ කලාසම ප්‍රස්තාර කරන්න.

## II කොටස

3) දේශීය ශාන්තිකර්ම අතර රටයකුම් ශාන්ති කර්මයෙන් අධ්‍යාත්මික ගුණ වගාවත් මානසික ප්‍රතිකර්මයක් සිදු වේ.

   i. රටයකුමේ නාට්‍යාමය අංක දෙකක් තුළින් සමාජ විශ්වාස පිළිබඳ විමසන්න.

   ii. එම ශාන්ති කර්මයෙන් නිරූපණය වන සමාජමය වටිනාකම සාකච්ඡා කරන්න.

   iii. රට යකුමේ නානුමුරයේ චරිත නිරූපණය යෙදෙන ආකාරය බෙර පද හා කවි ඇසුරින් විස්තර කරන්න.



Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

4) සිංහල ශාන්ති කර්ම වත්පිළිවෙත් සේම රංග අලංකරණයට ද ප්‍රමුඛත්වයක් දෙයි.

i. කිරි මඩු ශාන්තියේ චාරිත්‍ර විධි තුනක් පිළිබඳව හඳුන්වන්න.

ii. වලියක් මංගල්‍යයේ සමූහ නර්තන දෙකක් නම් කර එහි විශේෂතා පිළිබඳ සාකච්ඡා කරන්න.

iii. බලි මඩුව සැරසිල්ල, ප්‍රස්තුතය හා ගැලපීම පිළිබඳ සාකච්ඡා කරන්න.

5) ගැමි නැටුම් හා ගැමි නාටක මඟින් තත් කාලීන ජන සමාජයේ ජීවන රටාවන් විවරණය කරයි.

i. "තෙරුවන් හා දෙවියන් පෙරදැරි කරගෙන ගැමි ගායනා නිර්මාණය කර ඇති බව" ගැමි නැටුම් දෙකකට අයත් ගායනා ඇසුරින් සනාථ කරන්න.

ii. සොකරි නාටකයේ චරිත දෙකක් ඇසුරින් චරිත වල ස්වභාවය තිව්‍ර කිරීමට බෙර පද හා කවි ගායනා ඉවහල් වී ඇති අයුරු පැහැදිළි කරන්න.

iii. "කෝලම් නාටකය මගින් සමාජ දුෂ්චරිත උපහාසයට ලක් කරයි." මුදලි හා අණබෙර කෝලම් ඇසුරින් විමසන්න.

## <u>III කොටස</u>

6) ආගමික පසුබිම මත ගොඩ නැගුණු භාරතීය නර්තනය රාජ්‍ය අනුග්‍රහය මත දියුණුවට පත්විනි.

i. මණිපුරි නර්තනයේ ආරම්භයට බලපෑ ආගමික පසුබිම පිළිබඳව පරීක්ෂා කරන්න.

ii. කතකලී නර්තනයේ විකාශනය සඳහා බලපෑ රාජ්‍ය අනුග්‍රහය පිළිබඳව පරීක්ෂා කරන්න.

iii. මෝගල් ආභාෂයෙන් පසුව කතක් නර්තනයේ ඇති වූ වෙනස්කම් මොනවාදැයි විග්‍රහ කරන්න.

7)

i. චිත්‍ර කලාවේ මූලිකාංග නර්තන කලාව හා බැඳෙන අතර නව නිර්මාණ වල එය වඩාත් ඉස්මතු වේ. විමසන්න.

ii. අද්‍යතන අංග රචනය සඳහා යොදා ගන්නා ප්‍රධාන අමුද්‍රව්‍ය තුනක් නම් කර ඒ පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.

iii. ආලෝක වර්ණ සහ ද්‍රව්‍ය වර්ණ රංග වස්ත්‍රාභරණ සඳහා වැදගත් වන ආකාරය උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

8)

i. අද්‍යතන රූපවාහිනි නර්තන ප්‍රසංගයන් හි දක්නට ලැබෙන රංග වස්ත්‍ර හා වේශ නිරූපණ ක්‍රම ශිල්පවල නව්‍යකරණය පිළිබඳ අදහස් දක්වන්න.

ii. නව ප්‍රවණතා හමුවේ, සාම්ප්‍රදායික නර්තන කලාව සංරක්ෂණය කළ හැකිද? ඔබේ අදහස් දක්වන්න.

iii. සංස්කෘතික සාරධර්ම අගයන උසස් රසඥතාවයකින් පිරිපුන් පුරවැසියෙකු බිහි කිරීමට කලාව ඉවහල් වේ. විමසන්න.

PAST PAPERS WIKI



(11) WWW.PastPapers.WiKi (11)

Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

PARCEL NO

LOL.lk
BookStore

# විභාග ඉලක්ක
## පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න






කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්

PADANAMA PUBLICATION | pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | T | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

## සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න